**චතාරික සමයේ පළමු ඉරුදින- 2014 -03-09**

**තේමාව** : 'අපගේ නිදහස් කැමැත්ත නිවැරදි දේ සඳහා යොදවමු.¶

**හැඳින්වීම**

ආරම්භයේදී ආදම් සහ ඒව දෙවිඳුන්ගෙන් ලද නිදහස, උඩගුවෙන් අකීකරුකමින්, පාපී මාවතකට යොමුකර ගනිමින් දේව සබඳතාවෙන් දුරස් වූවෝය. එහෙත් තම ආදම් වූ කිතු සමිඳාණෝ දේව කැමැත්ත හඳුනාගෙන සියලු පරීක්ෂා ජයගනිමින් නැතිවූ දේව සබඳතාව මිනිසාට ලබාදීමට ජීවිතය පූජා කළ සේක. මෙසේ අද යාගික තේමාව මෙනෙහි කරන්නට අපට ආරාධනා කරනුයේ ලෝකයා ඉදිරියේ නිවැරදි දේ තෝරා ගන්නට අපට ලැබී ඇති නිදහස තුල උඩගුවෙන් අහංකාරයෙන් දේව සැලැස්ම ඉක්මවා ක්‍රියා කර ඇති අවස්ථා හා එදිනෙදා මුහුණ දෙන පරීක්ෂා හමුවේ කිතුණු දැක්මට දෙවෙනි තැන දෙමින් ධනය, කුලය, නිලය අයිති කර ගන්නට උත්සහ කළා කියා මෙහොතක් සිතන්නටයි. එසේනම් මේ දිව්‍ය යාගය තුල මනස්ථාපීව අපගේ අභ්‍යන්තර සිතිවිලි තේරුම් ගන්නට අවැසි මඟ පෙන්වීම පතා යාච්ඤා කරමු.

**ඇතුලුවීමේ ගීය** : කි. බැ.ගී. අංක 8- අහස පොළොව

**පළමු කියවීම** : උත්පත්ති 2/7-9, 3/1-7

දෙවියන් වහන්සේ මිනිසා දූවිල්ලෙන් මවා ඔවුන් ඉදිරියේ තැබූ නිදහස මිනිස් මනසින් තෝරා ගත් ආකාරය හේතුවෙන්, ලොවට පාපයත්, මරණයත්, උරුම වූ ආකාර මෙනෙහි කරන්නට අද උත්පත්ති පාඨය අපව යොමු කරවයි.

**මෙනෙහි කිරීමේ ගීය** : දේව වාක්‍ය සංග්‍රහයේ එදිනට නියමිත පිළිතුරු ගිය ගායනා කරන්න.

**දෙවන කියවීම** රෝම 5: 12-19

එක් මිනිසෙකුගේ පාපය හේතුවෙන් මරණය උරුම වුවත්, එක් මිනිසෙකුගේ කීකරුකම නිසා සියල්ලෝම දේව සබඳතාවයට හිමිකම් ලබන්නේයැයි ශු.පාවුළුතුමා රෝමවරුන්ට ප්‍රකාශ කරන්නේ නව ආදම් වූ කිතුණු වහන්සේ පිළිබඳවයි.

**සාදුකාරය :** මිනිසා ජීවත් වන්නේ කෑමෙන් පමණක් නොව දෙවියන් වහන්සේගේ මුවින් නික්මෙන සියලු වදන් වලින් යැයි ස්වාමීන් වහන්සේ වදාළ සේක.

**ශු. සුවිශේෂය**: මතෙව් 4 : 1-11

**විශ්වාසකයින්ගේ යැදුම්** **පිළිතුර** : ස්වාමිනී අපි කරන යාච්ඤා අසා වදාල මැනව.

1. ආදර දෙවි පියාණනී, මෙම චතාරික සමය අර්ථවත්ව මෙනෙහි කරමින් ජීවිත වෙනසක් ඇතිකර ගන්නට දේව ජනතාව මෙහෙය වන සාන්ත, සභා නයකත්වයට අවැසි ඥාණාලෝකය නිරතුරුව ලබා දෙන පිණිසද,

2. ආදර දෙවි පියාණෙනී, භේද භින්න වී ඇති දේශය සුවපත් කරමින් ජනතා හදවත් තුල සාමය උදාකර, දේශයේ ගිනි නිවා සාමය උදා කරන්නට වෙහෙසෙන සැමගේ උත්සහයන් සාර්ථක කරනු පිණිසද,

3. ආදර දෙවි පියාණෙනී, පාපයත්, මරණයත්, හිමිවූ මිනිස් අප ගැලවීමේ ජීවිත මඟ ගමන් කරන්නට නිරතුරු මඟ පෙන්වන කිතු සමිඳුන් හඳුනා ගෙන ජීවිත වෙනසක් මේ චතාරිකය තුල අත් දකින්නට අපට අවැසි ඥාණය ලබා දෙන පිණිසද,

4. ආදර දෙවි පියාණෙනී, ලෝකයේ විසිතුරු දේ ඉදිරියේ වහල් නොවී අත්‍යවශ්‍යම දේ පමණක් තෝරා ගන්නට දෙවිඳුන් අපට දුන් නිදහස, ජීවත ගොඩනැගීමට යොමු කර ගන්නට දුබල අප සවිමත් කරන පිණිසද,

**පඬුරු පිදීමේ ගීය** : කි.බැ.ගී. අංක 115- ලෝකේ පව් නිසා

**බොජුන් ගීය** : කි.බැ.ගී. අංක 189- ඉසුරු සැපත්

**අවසාන ගීය** : කි.බැ.ගී. අංක 257- සාමයේ ප්‍රිතියේ

දලුගම - අනෙක් පිට බලන්න

# චතාරික සමයේ පළමුවන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය උත්පත්ති 2: 7–9, 3: 1–7

*උත්පත්ති පොතෙන් උපටා ගත් කොටසකි.*

දෙවියන් වහන්සේ මැවූ ආදි මවුපියෝ පාපයට වැටුනාහ.

දෙවි සමිඳාණන් වහන්සේ පොළොවේ දූවිල්ලෙන් මනුෂ්‍යයා මවා ඔහුගේ නාස්පුඩු තුළට ජීවන හුස්ම හෙළූ සේක. මෙසේ මනුෂ්‍යයා ජීවමාන කෙනෙක් විය. දෙවි සමිඳාණන් වහන්සේ පූර්ව දිශාවේ, ඒදන්හි උයනක් තනා තමන් මැවූ මනුෂ්‍යයා එහි පිහිටෙවූ සේක. තවද, උන් වහන්සේ දැකුම්කලු, ප්‍රණීත පලදෙන සියලු ගස් ද උයන මැද ජීවන වෘක්ෂය ද හොඳ-නරක අවබෝධ කිරීමේ ගස ද භූමියෙන් හට ගන්නට සැලැසූ සේක.

දෙවි සමිඳාණන් වහන්සේ මැවූ වනයේ සියලු සතුන්ට වඩා සර්පයා උපායෙහි දක්ෂ විය. ඌ ස්ත්‍රියට කතා කොට, "උයනේ කිසි ම ගහක ගෙඩි කන්නට එපා කියා දෙවියන් කළ තහනම ඇත්ත දැ"යි ඇසී ය. ස්ත්‍රිය සර්පයාට උත්තර දෙමින්, "උයනේ ඕනෑ ම ගහක ගෙඩි කන්නට අපට අවසර ඇත. එහෙත්, උයන මැද තිබෙන ගහේ ගෙඩි කන්නටත්, ඒවාට අත ගසන්නටත් දෙවියන් වහන්සේ අපට තහනම් කර ඇත. එසේ කළොත් අප මැරෙනවාම ය" යි කීවා ය.

එවිට සර්පයා පිළිතුරු දෙමින්, "සැබැවින් ම. ඔබ මැරෙන්නේ නැත. ඔබ ඒ ගසේ ගෙඩි කන දවසේ දී ඔබගේ ඇස් පෑදී, දෙවියන් හා සමාන වී, ඔබත් හොඳ-නරක අවබෝධ කරගන්න බව දෙවියන් වහන්සේ දන්න නිසා එසේ වදාළ සේකැ" යි කී ය.

ස්ත්‍රිය ද ගස පෙනුමට කෙතරම් රමණීය ද පල කෙතරම් ප්‍රණීත ද නුවණ වැඩුමට කෙතරම් කදිම ද කියා දුටු විට එයින් ගෙඩි කිහිපයක් කඩා කෑවා ය. තමා සමග සිටි සිය සැමියාට ද ඉන් සමහරක් දුන් විට ඔහු ද කෑවේ ය. එවිට ඔවුන් දෙදෙනාගේ ම ඇස් පෑදී තමන් නග්න ව සිටි බව ඔව්හු තේරුම්ගත්හ. එබැවින් ඔව්හු අත්තික්කා කොළ එකට මසා ඉණ වැසුම් සාදාගත්හ.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 51: 1–4, 10–12, 15

පිළිතුර : දෙව් සමිඳුනි, පව්කාර අපට කරුණා කළ මැනව.

ගීය : දෙවිඳුනි, ඔබේ දයා කරුණාවෙන් මට අනුකම්පා කළ මැනව:
ඔබේ විපුල දයාවෙන් මාගේ අපරාධ මකාදැමුව මැනව.
මාගේ කෙලෙස් මලින් මා මුළුමනින් සෝදාලුව මැනව.
මාගේ පාප මලින් මා පිවිතුරු කළ මැනව.

මාගේ අපරාධ මම මැනවින් දනිමි.
දිවා රෑ දෙක්හි මාගේ පාප මට සිහි වේ.
ඔබට විරුද්ධ ව, ඔබට පමණක් විරුද්ධ ව මම පව් කෙළෙමි:
ඔබ හමුවෙහි මම නපුර කෙළෙමි.
එබැවින් ඔබේ තීන්දුව සාධාරණ ය:
ඔබේ විනිශ්චය යුක්ති සහගත ය.

දෙවිඳුනි, මා තුළ නිර්මල සිතක් මවා වදාළ මැනව:
නිරසර නව ආධ්‍යාත්මයක් මට දුන මැනව.
ඔබ හමුයෙන් මා පලවා නොහැරිය මැනව:
ඔබේ ශුද්ධාත්මය මා කෙරෙන් ඉවත් නොකළ මැනව.

විමුක්තියේ ප්‍රීතිය මට යළි දුන මැනව:
අවනත සිතක් දී මා දැරුව මැනව.
සමිඳුනි, ගී ගැයුමේ වරම මට දුන මැනව.
එවිට මා මුවින් ඔබ පැසසුම් ගයන්නෙමි.

## දෙවන දේව ප්‍රකාශනය රෝම 5: 12–19

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

දෙවන ආදම් වන ක්‍රිස්තුස් වහන්සේගෙන් දැහැමිබව ලැබේ.

එක මනුෂ්‍යයෙකු නිසා පාපයත්, පාපය නිසා මරණයත් ලෝකයට පිවිසියාක් මෙන්, සියලු මනුෂ්‍යයන් පව් කළ බැවින්, මරණය මුළු මිනිස් සංහතියට ම පොදු ව පවතී. කිසි ම නීතියක් ඇති වීමට පෙර ලෝකයෙහි පාපය තිබිණි. එහෙත් නීතියක් නැති තැන මිනිසාට විරුද්ධ ව පාපය ගණින් ගනු නොලැබේ. එසේ ව තිබියදීත්

ආදම් පටන් මෝසෙස් දක්වා, ආදම් මෙන් ආඥා කඩ කිරීමෙන් පව් නොකළ අය කෙරේ පවා මරණය රජකම් කළේ ය. ආදම් වනාහි එන්නට සිටින තැනැන් වහන්සේ පිළිබඳ පූර්ව ආදර්ශයක් විය. එහෙත් දෙවියන් වහන්සේගේ වරප්‍රසාදයේ ක්‍රියාවත්, ආදම්ගේ පාපී ක්‍රියාවත් අතර සමානත්වයක් නැත. එසේ කියන්නේ, එක මිනිසෙකුගේ පාපය හැම මිනිසාගේ ම මරණයට හේතු වූ නමුත්, දෙවියන් වහන්සේගේ වරප්‍රසාදය හා ජේසුස් ක්‍රිස්තුස් නම් එක මනුෂ්‍යාගේ දයාන්විත දීමනාව බොහෝ දෙනෙකුට විපුල ආසිරි ගෙන දීමේ අමුතු ම හේතුවක් වූ බැවිනි. දෙවියන් වහන්සේගේ දීමනාව හා එක පුද්ගලයෙකුගේ පාපී ක්‍රියාව අතර සමානත්වයක් නැත.

මන්ද, එක පාපී ක්‍රියාවක් නිසා ඇති වන දේව විනිශ්වය, දඬුවමට හේතු විය: එහෙත් බොහෝ පාපී ක්‍රියා සම්බන්ධයෙන් ඇති වූ උන් වහන්සේගේ දයාන්විත දීමනාව, වරදින් නිදහස් කිරීමේ තීන්දුව දෙයි. එක මනුෂ්‍යයෙකුගේ පාපය නිසා එක ම තැනැත්තෙකු මඟින් මරණය සියල්ලන් කෙරෙහි රජකම් කළේ නම්, කොතරම් අධිකතර ලෙස දේව වරප්‍රසාදය හා දමිටු බවට පැමිණවීමේ දීමනාව ලබන හැම දෙන ම එක ම ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කරණකොටගෙන ජීවනයේ රජකම අත් කර නොගනිද් ද? මෙසේ එක මිනිසෙකුගේ පාපී ක්‍රියාව නිසා හැම මිනිසාට ම දඬුවමේ ඉරණම පැමිණියේ නම්, එක මිනිසෙකුගේ දමිටු ක්‍රියාව නිසා හැමට ම ජීවනදායක නිදොස්කමේ වරප්‍රසාදය ලැබෙනු ඇත. එක මිනිසෙකුගේ අකීකරුකමින් සියල්ලන් ම පව්කාරයන් වූ සේ ම, එක මිනිසෙකුගේ කීකරුකමින් සියල්ලෝ ම දමිටු බවට පමුණුවනු ලබන්නෝ ය.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද

මතෙව් 4: 4

"මිනිසා ජීවත් වන්නේ කෑමෙන් පමණක් නොව:
දෙවියන් වහන්සේගේ මුවින් නික්මෙන සියලු
වචන වලින් ය" යි ස්වාමින් වහන්සේ වදාළ සේක.

## සුවිශේෂය

මතෙව් 4: 1 – 11

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

### ක්‍රිස්තුස් වහන්සේ, පරීක්ෂාකාරයා ජය ගති.

එකල ජේසුස් වහන්සේ යක්ෂයා විසින් පරීක්ෂා කරනු ලබන පිණිස ශුද්ධාත්මයාණන් විසින් පාළුකරයට පමුණුවනු ලැබූ සේක. දහවල් සතළිසක් ද, රෑ සතළිසක් ද නිරාහාර ව උන් පසු උන් වහන්සේට සාගිනි ඇති විය. එවිට පරීක්ෂාකාරයා උන් වහන්සේ වෙත අවුත්, "ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් මේ ගල් ගෙඩි පාන් වන්න අණ කළ මැනවැ"යි කී ය. උන් වහන්සේ උත්තර දෙමින්, 'මිනිසා ජීවත් වන්නේ කෑමෙන් පමණක් නොව: දෙවියන් වහන්සේගේ මුවින් නික්මෙන සියලු වචන වලින් ය' කියා ලියා ඇතැ" යි වදාළ සේක.

එවිට යක්ෂයා උන් වහන්සේ ශුද්ධ නුවරට පමුණුවා දේව මාළිගාවේ කොත මුදුනේ සිටුවා, "ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම්, පහතට පනින්න: 'උන් වහන්සේ සිය දූතයන්ට ඔබ ගැන අණ දෙනු ඇත. ඔබේ පය කිසිසේත් ගලක නොවදින පිණිස, ඔව්හු සිය අත්වලින් ඔබ උසුලනු ඇතැ'යි ලියා තිබේ ය"යි උන් වහන්සේට කී ය. ජේසුස් වහන්සේ ද කතා කොට, 'තාගේ දෙවි ස්වාමීන් වහන්සේ පරීක්ෂා නොකරන්න' කියාත් ලියා ඇතැ"යි වදාළ සේක.

යළිත් යක්ෂයා උන් වහන්සේ ඉතා උස් කන්දකට පමුණුවා, ලෝකයේ සියලු රට රාජ්‍යයන් සහ ඒවායේ යසශ්‍රීය උන් වහන්සේට පෙන්වා, "ඔබ දණින් වැටී මට නමස්කාර කරන්නෙහි නම්, මේ සියල්ල ඔබට දෙන්නෙමි."යි උන් වහන්සේට කී ය. එවිට ජේසුස් වහන්සේ, කතා කරමින්, "සාතන් පලා යව! 'තුඹේ දෙවි ස්වාමීන් වහන්සේට නමස්කාර කරන්න: උන් වහන්සේට පමණක් සේවය කරන්න.' කියා ලියා ඇතැ" යි ඔහුට වදාළ සේක.

එකල යක්ෂයා උන් වහන්සේ අත්හැර ගියේ ය. දේව දූතයෝ අවුත් උන් වහන්සේට උපස්ථාන කළහ.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*



# “සාතන් පලා යව!”

*චතාරික සමයේ පළමුවන ඉරුදින - 05-03-2017*

## හැඳින්වීම

අද චතාරික සමයේ පළමු ඉරුදිනයි. චතාරිකය අපේ අධ්‍යාත්මික ජීවිතය දළු දමා මල් ඵල ගැන්වෙන වසන්ත කාලයකට සමානය. මැණිකක් කැපීමෙන් අගය වැඩිකර ගන්නාක් මෙන් ගැඹුරු අධ්‍යාත්මික අභ්‍යාස තුළින් අපේ ජීවිතද ඔප මට්ටම් කරගැනීමට කාලයයි මේ. යාච්ඤාව, එක්වරුශීල රැකීම සහ දයාවේ ක්‍රියා වෙත අපේ අවධානය මුළුමනින් ම යෙදවිය යුතුය. මෙම කාලය තුළදී අපි සදාතන ජීවිතය ලැබීමට අපේ නුසුදුසුකම පිළිගන්නෙමු. එමෙන්ම අපේ පව්කාරකම කෙතරම් විශාල වුවද ඊට වඩා ශ්‍රේෂ්ඨ වන දෙවියන් වහන්සේගේ අපරිමිත දයාව කෙරෙහි විශ්වාසය තබමින් උන්වහන්සේ වෙත හැරී එන්නෙමු. එවිට පාස්කු ඉරුදින මංගලෝත්සවය උත්සවශ්‍රීයෙන් සැමරීමට අපි නියම සුදුස්සන් වන්නෙමු.

## දේව වචනය

මිනිසා මැවීම සහ ඔහුගේ වැටීම අද පළමු කියවීමෙන් විස්තර කෙරේ. ආදම් සහ ඒවගේ පාපයට වැටීම යනු හුදෙක් පුද්ගලයින් දෙදෙනෙකුගේ වරදට වැටීම පමණක් විදහා දක්වන හුදකලා සිද්ධියක් නොව මුළු මනුෂ්‍ය වර්ගයාගේම ඇද වැටීම නිරූපණය කරන කතා වස්තුවකි. එය පරීක්ෂාව ජයගන්නට අසමත්වීමේ ඛේදවාචකයයි. ලෝකය මැවීම සහ මිනිසාගේ වැටීම යනු ප්‍රධාන දේවධාර්මික සත්‍යතාවයන් දෙකකි. උත්පත්ති පොතේ මේවා විස්තර කරන්නේ කතන්දර වල ස්වරූපයෙනි. එමනිසා ඒවායේ දේවධාර්මික අර්ථය හැර ඓතිහාසික හෝ විද්‍යාත්මක පසුබිම වැදගත් නොවේ.

**උත්පත්ති 2:7-9, 3:1-7**

**ගීතාවලිය 51:1-4, 10-12, 15**

**රෝම 5:12-19**

**මතෙව් 4:1-11**

යක්ෂයාගේ බසට රැවටී ආදි මව්පියන් පාපයට වැටුණද යක්ෂයාව උගේම උපාය වලින් හසුකරගත හැකි බවත්, ක්‍රිස්තුන් වහන්සේ මනුෂ්‍යයෙක්ව ඉපිද එසේ කළ ආකාරයත් ශු. මතෙව් තුමා සුවිශේෂය තුළින් විස්තර කර දෙයි. මෙය ජනවන්දනා චක්‍රයේ තුන්වන වසරේ අප සවන් දෙන ලූක් තුමාගේ විස්තරයට බොහෝ සෙයින් සමානය. වෙනස් වන්නේ දෙවන සහ තුන්වන පරීක්ෂාවන් වල අනුපිළිවෙල පමණි. ආදම්ගේ පහසු ඇදවැටීම ක්‍රිස්තුන් වහන්සේගේ ගැළැවීමේ කාර්යයේ අනගිභවනීය බව වඩ වඩාත් ඉස්මතු කරවයි. පරීක්ෂාව ජයගන්නට ක්‍රිස්තුන් වහන්සේ උදව් කරගන්නේ ශුද්ධවූ ලියවිල්ලයි. පාපය පිටුදැකීමට දේව වචනය අපට අත්වැළකි.



ශු. පාවුළු තුමා රෝමවරුන්ට යවන ලිපියෙන් ක්‍රිස්තුන් වහන්සේව නව ගිවිසුමේ ආදම් ලෙස ඉදිරිපත් කරයි. එක් මිනිසෙකුගේ ක්‍රියාව නිසා සදාතන ජීවනය අහිමි වූ අපට තවත් මනුෂ්‍යයකුගේ දිවි පිදීම කරණකොට ගෙන ගැළැවීම උරුම විය. එහෙත් මෙම ක්‍රියාවන් අතර සමානකමක් නැත. ආදම් මානව සංහතියට පාපය සහ මරණය රැගෙන ආවේය. එහෙත්

ක්‍රිස්තුන් වහන්සේ ඉතිහාසය අලුත් කරමින් ධර්මිෂ්ඨබවේ සහ ජීවනයේ යුගයක් ආරම්භ කළ සේක.

## මෙනෙහි කිරීම

සෑම වසරක ම චතාරික සමයේ පළමුවන ඉරිදා සුවිශේෂය අපට ඉදිරිපත් කරන්නේ ක්‍රිස්තුන් වහන්සේ මුහුණ දුන් පරීක්ෂාවන් ගැන විස්තරයයි. උන්වහන්සේ පාළුකරයේ දින හතළිහක් පුරා ලැබූ අත්දැකීම සුළුවෙන් හෝ විඳ ගන්නට චතාරික කාලය තුළ දී උත්සහ කරන අපට අපගේ අධ්‍යාත්මික සටන සඳහා උන්වහන්සේගේ සටනින් ලබා ගත හැකි පාඩම් බොහෝ ය.

මතෙව් තුමා සඳහන් කරන අනුපිළිවෙලට යක්ෂයා ජේසුන් වහන්සේව පරීක්ෂා කරන්නේ මූලික කරුණු තුනක් කේන්ද්‍ර කරගෙනය. ඒවා නම්, ආහාර, කීර්තිය හා බලය වේ. කෙසේවෙතත් යක්ෂයාගේ වචන දෙස කල්පනාවෙන් බැලූ විට පෙනී යන්නේ මීට වඩා සියුම් අරමුණක් ඒ තුළ තිබූ බවයි. ජේසුන් වහන්සේ පාළුකරයට පැමිණීමට පෙර ජෝර්දාන් ගඟේ දී බෞතීස්මය ලබාගත් සේක. එහිදී පියාණන් වහන්සේ "මේ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝ" යැයි ප්‍රකාශ කළ සේක. පියාණන් වහන්සේ ප්‍රසිද්ධියේ අනාවරණය කළ දේ දැන් යක්ෂයා විසින් අප්‍රසිද්ධියේ පරීක්ෂාවට ලක්කරනු ලබයි. පළමු පරීක්ෂාවන් දෙක ම "ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම්..." ලෙස ආරම්භ වන්නේ ඒ නිසා ය. යක්ෂයාට උවමනා අනාවරණය කරන ලද දේව පුත්‍රභාවය පිළිබඳව ජේසුන් වහන්සේ තුළ සැකයක් ඇතිකරලීමටයි. එසේ කොට උන්වහන්සේව ලෝකය ගළවා ගැනීමේ මෙසියානික දූත කාර්යයෙන් වෙනතකට හැරවීමටයි. මේ යක්ෂයාගේ ප්‍රධාන ම උපක්‍රමයයි. ඌ බොරු කියයි. මන්ද "ඌ බොරුවේ පියා ය" (ශු. ජුවාම් 8:44).



යක්ෂයා අපට කරන්නේත් මේ දෙය ම නොවේ ද? ඌ බොරුවෙන් අපව රවටයි. බලන්න, පළමු කියවීමේ සඳහන් ආදම් සහ ඒවට සිදුවූ දේ. උයන මැද ඇති ගසේ ගෙඩි කන්නට එපා යැයි දෙවියන් වහන්සේ ඔවුන්ට අණ කරන්නේ එසේ කළොත් ඔවුන් මැරෙන බව පවසමිනි. එහෙත් යක්ෂයා කියනුයේ "මොන බොරුද? ඔබ මැරෙන්නේ නෑ. ඒ ගහේ ගෙඩි කෑවම ඔබත් දෙවියන් වහන්සේට සමාන වෙනවා"යි කියාය. අපේ අවාසනාවේ සහ අනුවණකමේ තරම කෙතරම් ද යත් අපි හැමදාමත් ඌට රැවටෙන්නෙමු.

අපි මෙහෙම රැවටෙන්නේ ඇයි? මන්ද යක්ෂයා උගේ වාටු බස් අපේ සිත් වලට ඇතුළු කරන්නේ අප හිතන තරම් කැත, රළු, පිළිකුල් සහගත ආකාරවලින් නොවේ. එසේ වූවා නම් අපට පහසුවෙන් ම ඒවා හඳුනාගත හැකිව තිබුණි. යක්ෂයාගේ කතාව ඇසූ ඒව හැරී බලන විට "ගස පෙනුමට කෙතරම් රමණීය ද පල කෙතරම් ප්‍රණීත ද නුවණ වැඩුමට කෙතරම් කදිම ද කියා දුටු විට එයින් කිහිපයක් කඩා කෑවාය." **ගසේ ගෙඩි අවලස්සනව, ගඳ ගසමින් තිබුණි නම් ඇය නොකන්නට ඉඩ තිබුණි. අපට සිදුවන්නේ ද මෙයම ය. පරීක්ෂාවන් අප වෙත එන්නේ ඉතා සියුම්, ආකර්ශණීය මාර්ග වලිනි. බොහෝ වෙලාවට පරීක්ෂාවට වැටුණු බවවත් අපි නොදනිමු.**

පාපය ලස්සනය. පව් කරන කළ ඉතා මිහිරිය. මිනිසුන් පව් කරන්නේ එයින් සතුටක් ලැබෙන නිසාය. සොරකම් කරන්නේ ඒවායින් තෘප්තියක් ලැබීමටය. අනියම් සම්බන්ධතාවයක පැටලෙන්නේ එයින් සතුටක් ලබාගැනීමට ය. කයිවාරු ගහන්නේ තමන්ගේ වටිනාකම වැඩිකර ගැනීමේ ස්වතෘප්තිය ලැබීමටය. මෙලෙස සෑම පාපයකින් ම තාවකාලික සතුටක් ලැබේ. යක්ෂයා මේ සතුට පිළිබඳව අපේ සිතට යමක් ඇතුළු කළ විගස අපි ඊට හසුවන්නෙමු. ආශාවට වහල් වන්නෙමු. මන්ද ලෝකයා තුළින් ඌ පෙන්වන ජීවිතය මතුපිටින් ඉතා ලස්සනය.

අපි දුවිලි තරමවත් නොවටිනා බව සැබෑ ය. එහෙත් දෙවියන් වහන්සේ අපට කොන්දේසි විරහිතව ප්‍රේම කර අපට වටිනාකමක් දෙන සේක. ක්‍රිස්තුන් වහන්සේ තුළ අප සෑම කෙනෙක්ව ම උන්වහන්සේගේ දරුවෙකු/දැරියක බවට පත්කරගෙන ඇත. අපට උවමනා කරන ආදරය, රැකවරණය, ආශිර්වාදය පමණක් නොව සියලු ලෞකික අවශ්‍යතා පවා

පියාණන් වහන්සේ සම්පූර්ණ කරන සේක. **යක්ෂයා අපට මුහුණ දීමට සලස්වන ප්‍රධාන ම පරීක්ෂාව නම් මේ සත්‍යය අමතක කර දැමීමට සැලැස්වීමයි. ඌ මේක කරන්නේ කොහොමද? අප වටා සිටින අයගේ වචන, පොත පත, ජනමාධ්‍යය හරහාය**. "දෙවි කෙනෙක් නෑ. ඔබව බලා ගන්න කෙනෙක් නෑ. ඔබේ වටිනාකම ඔබම ඇතිකර ගත යුතුයි. ඔබ වටිනා පුද්ගලයෙකු බව ලෝකයට පෙන්වන්න. නැත්නම් ඔබට පිළිගැනීමක් ලැබෙන්නෙ නෑ. එහෙම වුනොත් ඔබට සතුටක් නෑ. ජීවිතයෙන් වැඩක් නෑ" යක්ෂයා මෙහෙම කියයි. කුඩා කළ පටන් අප හැඩගැසෙන්නේ මෙවැනි සෝෂාවන් රාශියක් මැදයි. ප්‍රශ්නයක්, කරදරයක් මැද දී "මගේ ජීවිතයෙන් වැඩක් නෑ. මට ආදරේ කරන්න කෙනෙක් නෑ. මම තනිවෙලා..." ලෙස සිතන්නට යක්ෂයා අපව පොළඹවයි. අප එනතුරු බාලගෙන සිටින ආදරබර පියෙකු අප සැම කෙනෙකුට ම සිටින බව ඌ අපට අමතක කරවයි.

**කොපමණ වාරයක් අපි නිවැරදි තීරණ අරගෙන යහපත් ලෙස ජීවත් වන්නට අධිෂ්ඨාන කරගෙන ඇත්ද? ඒත් පසුව යම් යම් සිදුවීම් හා විවිධ පුද්ගලයින්ගේ අදහස්, උපදෙස් නිසා අපේ තීරණ වෙනස් කරගන්නට ඇත්ද?** ඔබව අසාධාරණයට ලක්වූ මොහොතක් ගැන සිතන්න. අමාරුවෙන් හෝ එම පුද්ගලයාට සමාව දෙන්නට ඔබ තීරණය කරයි. එහෙත් තවත් අය, "ඕක ලෙහෙසියෙන් අත අරින්න එපා, සද්ද නැතුව ඉන්න එපා, එයාගෙ වැරැද්ද තේරෙන්න අරින්න ඕනෙ, ඔයා හොඳ වැඩියි, ඔයා කරනවා වැඩියි..."ලෙස උපදෙස් දෙයි. බොහෝ විට මෙසේ කියන්නේ අපේ ළඟ ම හිතවතුන් හෝ පවුලේ ම අය විය හැක. කවුද මේ ඔවුන් තුළින් කතා කරන්නෙ? තවත් වෙලාවක ඔබට දුප්පතුන් වෙනුවෙන් යමක් දීමට සිතෙයි. 'මේ මාසෙ ඉඳලා මම ආදායමෙන් මෙච්චර කොටසක් වෙන්කරනවා' ඔබ සිතා ගනියි. එහෙත් ඉතුරුවක් කරගැනීමට නම් ඔබ අසා කරන දේවල් කිහිපයක් හෝ අත්හැරීමට සිදුවෙයි. "අලුත් ඇඳුමක් නැතුව කොහොමද පාටියට යන්නෙ? කට්ටිය මොනව හිතයිද දන්නෙ නෑ. ගෙදරට අලුත් පුටු ටිකක් නැතුව කොහොමද? මිනිස්සු හිතයි මම ලෝභයෙක් කියලා.." මාසය ගෙවී යද්දී යක්ෂයා මෙවා ඔබේ ඔළුවට දමයි.



අපව අධෛර්යමත් කරන, වැරදි මාර්ග වලට යොමු කරන, යහපත් දේ කිරීමෙන් වළක්වන මෙවැනි බොහෝ අදහස් හා උපදෙස් දවස පුරාම අපට ලැබේ. අපට සිතෙන්නේ මේවා අපේ යහපත වෙනුවෙන් ලැබෙන උපදෙස් ලෙසට ය. එමනිසා අපි නොදැනුවත්ව ම ඒවාට හසු වන්නෙමු. සාර්ථක පුද්ගලයෙක් වීමට, සතුටින් ජීවත් වීමට, දියුණු වීමට, අවශ්‍ය කරන දේ පිළිබඳව ජනමාධ්‍යයෙන් සහ සමාජයෙන් කොපමණ උපදෙස් ලැබෙනවාද? ජීවත් වීමට අහවල් ප්‍රදේශයෙන් ඉඩමක්, උදේට මේ ජාතියෙන් තේ කෝප්පයක්, නිදාගන්න අහවල් තාක්ෂණයට අනුව නිපැයූ මෙට්ටයක්, සිහින් සිරුරක්, ලස්සන කෙස් කළඹක්, ස්මාට් ෆෝන් එකක්.... මේවා නැතුව ජීවිතයේ සතුට ළඟා කරගන්න බැරි බව නේද ලෝකයා පුන පුනා කියන්නෙ? මේ පරීක්ෂාවන් ජයගන්නට අපට පුළුවන් වෙලා නෑ නේද? අපි තවමත් සතුට හොයන්නෙ ලෝකය තුළ නේද?

කොහොමද අපි පරීක්ෂාවන් ජයගන්නෙ? ඒක අපි ක්‍රිස්තුන් වහන්සේගෙන් ඉගෙන ගමු. ක්‍රිස්තුන් වහන්සේට පරීක්ෂාවන් ජයගන්නට හැකි වූයේ උන්වහන්සේ දේව පුත්‍රයාණන් වූ නිසා යැයි සමහරු වරදවා සිතති. උන්වහන්සේගේ දේවත්වය කිසි මොහොතක දී නැති වූයේ නැත. එහෙත් උන්වහන්සේ පරීක්ෂාවට මුහුණ දුන්නේ මනුෂ්‍යයෙකු ලෙස පමණි. එමනිසා අප මුහුණ දෙන පරීක්ෂාවන් වල ස්වභාවය උන්වහන්සේ හඳුනන සේක. ඒවාට මුහුණ දීමේ දී ඇති දුෂ්කරතා දන්නා සේක. අපට එමනිසා උන්වහන්සේගෙන් ඉගෙනගත හැකිය. "උන්වහන්සේ ම පරීක්ෂා කරනු ලැබ දුක් වින්ද බැවින්, පරීක්ෂා කරනු ලබන්නන්ට සරණ වීමට උන්වහන්සේට පිළිවන" (හෙබ්‍රෙව් 2:18).

ජේසුන් වහන්සේ පරීක්ෂාවට මුහුණ දීමේ දී යොදාගත් ආයුධය කුමක්ද? තුන් වතාවේ දී ම

උන්වහන්සේ යක්ෂයාට පිළිතුරු දෙන්නේ ශුද්ධ ලියවිල්ල ගෙනහැර පාමිනි. අප සතු ආයුධය ද එයමය. "දෙවියන් වහන්සේගේ වචනය ජීවමාන ය; ක්‍රියාශීලී ය; දෙමුවහත් කඩුවකටත් වඩා තියුණු ය" (හෙබ්‍රෙව් 4:12). **ලෝකයාගේ පුහු මත වලට හසුවී අප රැල්ලට විසි වී යන්නේ ශුද්ධ ලියවිල්ල සමග අපට හොඳ සම්බන්ධතාවයක් නැති නිසාය. යක්ෂයාගේ උපක්‍රම ඉදිරියේ දේව කැමැත්ත කුමක්දැයි සොයා ගැනීමට තරම් අපට ශුද්ධ ලියවිල්ල පිළිබඳව අවබෝධයක් නැත. "සාතන් පලා යව"යැයි අණ කරන්නට අපට ශක්තියක් නැත.** එමනිසා මේ චතාරික කාලය ශුද්ධ ලියවිල්ලට සමීප වීමට අවස්ථාවක් කරගන්න. නොවරදවා ම දිනපතා පූජාවේ කියවීම් කියවා මෙනෙහි කිරීමට උත්සහ කරන්න. ලෝකයේ මායාකාරී හඬවල් වලට වැඩියෙන් දෙවියන් වහන්සේගේ වචනයට ඔබ තුළට ඇතුළු වීමට ඉඩ දෙන්න.

අද දෙවන කියවීම ආදම් සහ ක්‍රිස්තුන් වහන්සේ අතර වෙනස්කම් ගෙන හැර පායි. පළමු මනුෂ්‍යයා වූ ආදම්ගේ වැටීම තුළින් මනුෂ්‍ය සංහතියට මරණය පැමිණියේය. ක්‍රිස්තුන් වහන්සේගේ ජයග්‍රහණය තුළින් මනුෂ්‍යයාට අලුත් ජීවිතයක් පිළිබඳ බලාපොරොත්තුවක් ලැබිණි. ඔබ ජීවත් වීමට කැමති කවුරු වගේද? කොපමණ වාරයක් ඔබ ආදම් මෙන් වැටෙනවාද? කොපමණ වාරයක් ඔබ ක්‍රිස්තුන් වහන්සේ මෙන් පාපය ත්‍යාජ කරන්නට උනන්දු වෙනවාද?

*"දෙවිඳුනී, ඔබේ දයා කරුණාවෙන් මට අනුකම්පා කළ මැනව. ඔබේ විපුල දයාවෙන් මගේ අපරාධ මකා දැමුව මැනව. මාගේ කෙලෙස් මලින් මා මුළුමනින් සෝදාලුව මැනව. මාගේ පාප මලින් මා පිවිතුරු කළ මැනව." (පිළිතුරු ගීය)*

*irudinasupuwatha@gmail.com*